සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 10 ශ්‍රේණිය
## පුරවැසි අධ්‍යාපනය - I

නම/විභාග අංකය :-- ........................................................................... කාලය : පැය 01යි.

උපදෙස්:

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.
- 1 - 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (6) ලකුණ යොදන්න.

(1) වර්තමානයේ ලෝකයේ බොහෝ රටවල දක්නට ලැබෙන පාලන ක්‍රමය වන්නේ,
(1) රාජාණ්ඩු ක්‍රමය (2) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය
(3) රදළ ආණ්ඩු ක්‍රමය (4) ඒකාධිපති පාලන ක්‍රමය

(2) කෘෂි ආර්ථික රටාව වෙනුවට වාණිජ ආර්ථිකයක් ගොඩ නැගීම ආරම්භ වූයේ,
(1) ක්‍රි. ව. 20 වන සියවසෙන් පසුව ය. (2) ක්‍රි. ව. 18 වන සියවසෙන් පසුව ය .
(3) ක්‍රි. ව. 15 වන සියවසෙන් පසුව ය. (4) ක්‍රි. ව. 16 වන සියවසෙන් පසුව ය.

(3) ජනතා නියෝජිතයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීමේ ක්‍රියාවලිය ආරම්භ වූයේ,
(1) ප්‍රංශ විප්ලවයෙන් පසුව ය. (2) ඉංග්‍රීසි විප්ලවයෙන් පසුව ය.
(3) රුසියානු විප්ලවයෙන් පසුව ය. (4) කාර්මික විප්ලවයෙන් පසුව ය.

(4) ප්‍රජාතන්ත්‍රවාදය යනු සියලු දෙනාට ම අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමයක් බව ප්‍රකාශ කළේ,
(1) සීලර් ය. (2) ඒබ්‍රහම් ලින්කන් ය.
(3) ඊ. ටී. හිලර් ය. (4) මහාචාර්ය ගානර් ය.

(5) ක්‍රමවත් ප්‍රතිපත්ති මාලාවක් පදනම් කරගෙන, පාලන බලය ලබා ගැනීමේ අරමුණින් සංවිධානය වූ කණ්ඩායම හඳුන්වන්නේ,
(1) සේවා කණ්ඩායම නමිනි. (2) පාලිත කණ්ඩායම නමිනි.
(3) පරිපාලන කණ්ඩායම නමිනි. (4) දේශපාලන පක්ෂය නමිනි.

(6) වර්තමාන ලෝකයේ ව්‍යාප්ත ව ඇති පක්ෂවල ස්වරූප ගණන වන්නේ,
(1) දෙකකි (2) එකකි (3) තුනකි (4) හතරකි

(7) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කරනු ලබන්නේ,
(1) පළාත් පරිපාලන අමාත්‍යාංශයයි
(2) මිනින්දෝරු දෙපාර්තමේන්තුවයි
(3) මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කොමිසන් සභාවයි
(4) ජනගහන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවයි.

(8) A මාතර B පොළොන්නරුව C බදුල්ල
D රත්නපුර E නුවරඑළිය F කෑගල්ල
ඉහත දිස්ත්‍රික්ක අතුරින් සබරගමු පළාතට අයත් දිස්ත්‍රික්ක දෙක වන්නේ,
(1) A හා B (2) C හා F (3) E හා F (4) D හා F

(9) වර්තමාන ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක ගණන
(1) විසි දෙකකි (2) විස්සකි (3) විසි තුනකි (4) විසි පහකි

(10) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පැවැත්ම සඳහා නිදහස් මාධ්‍ය මගින් ඉටු කළ යුතු කාර්යයක් ඇතුළත් පිළිතුර වන්නේ,
(1) සත්‍ය හා නිවැරදි තොරතුරු ජනතාවගෙන් වසන් කිරීම
(2) පක්ෂග්‍රාහී තොරතුරු සැපයීම
(3) පාලකයන් ප්‍රජාතන්ත්‍රවාදී මාවතට යොමු කිරීම
(4) ජනතාව වෙත ගලායන දැනුම පාලනය කිරීම

(11) රාජ්‍යයකට අයත් 'භූමිය' යන ආයතනයට ඇතුළත් නොවන කරුණක් වන්නේ,
(1) භූමිය මත සිටින සියලු ජීවීන් (2) නිශ්චිත දේශ සීමාවලින් වට වූ ගොඩබිම
(3) ගොඩබිම වටා ඇති මුහුදු සීමාව (4) භූමියට ඉහළින් ඇති අහස් කුස

(12) ලෝකයේ පළමුව බිහි වූ ජාතික රාජ්‍ය දෙක අනුව සංවිධානය වූ අනෙකුත් ජාතික රාජ්‍ය දෙක වන්නේ,
(1) ජර්මනිය හා ඉතාලිය (2) ජපානය හා රුසියාව
(3) එංගලන්තය හා ග්‍රීසිය (4) ඇමරිකා එක්සත් ජනපදය හා චීනය

(13) ජනාධිපති ආණ්ඩු ක්‍රමයක ජනාධිපතිවරයා සතු කාර්යයක් වන්නේ,
(1) නීති සම්මත කිරීම (2) විධායකයේ ප්‍රධානියා ලෙස කටයුතු කිරීම
(3) මුදල් පාලනය (4) ප්‍රශ්න ඇසීම

(14) බලයෙහි අවසාන හිමිකරුවා වන්නේ,
(1) ජනතාවයි (2) අගමැතිවරයායි
(3) ජනාධිපතිවරයායි (4) පොලිස්පතිවරයායි

(15) ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීමේ දී පළාත් පාලන ආයතන තුනට අයත් නොවන ආයතනය වන්නේ,
(1) මහ නගර සභාව (2) නගර සභාව (3) පළාත් සභාව (4) ප්‍රාදේශීය සභාව

(16) ප්‍රාදේශීය පාලනය පහසු කර ගැනීම සඳහා පළාත් මට්ටමින් රෙසිඩන්ට්වරයෙකු පත් කරන ලද ජාතීන් වන්නේ,
(1) බ්‍රිතාන්‍යයන් (2) පෘතුගීසීන් (3) ප්‍රංශ ජාතීන් (4) ලන්දේසීන්

(17) ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීම යටතේ පළමුව ආරම්භ කළ මහ නගර සභා දෙක වන්නේ,
(1) කොළඹ, මහනුවර (2) යාපනය, ගාල්ල
(3) නුවරඑළිය, කොළඹ (4) මහනුවර, මාතලේ

(18) පළාත් ආණ්ඩුකාරවරයාගේ නිල කාලය වන්නේ,
(1) වසර හයකි (2) වසර පහකි (3) වසර තුනකි (4) වසර දෙකකි

(19) පළාත් සභාවක මන්ත්‍රීවරු සංඛ්‍යාව තීරණය කරනු ලබන්නේ,
(1) සමස්ත භූමි ප්‍රමාණය හා ජනගහනය (2) ආදායම හා තරාතිරම
(3) ආදායම හා ජනගහනය (4) පළාතේ වර්ග ප්‍රමාණය හා ජනගහනය

(20) මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභා යන ආයතන දෙවර්ගයට ම සමසේ භුක්ති විඳිය හැකි බලතල අයත් ලැයිස්තුව වන්නේ,
(1) පළාත් සභා ලැයිස්තුව (2) සංවෘත ලැයිස්තුව
(3) සමගාමී ලැයිස්තුව (4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

(21) මහ නගර සභාවක ප්‍රධානියා වන්නේ,
(1) නගරාධිපති (2) සභාපති (3) ආණ්ඩුකාරවරයා (4) ප්‍රධාන ඇමති

(22) ඇමරිකා එක්සත් ජනපදය නැමැති රාජ්‍ය බිහි වන විට එහි පැවති ප්‍රාන්ත ගණන වන්නේ,
(1) විසි හයකි (2) පනහකි (3) විසි එකකි (4) දහතුනකි

(23) ප්‍රංශය, ඉතාලිය, ජර්මනිය සහ ඕස්ට්‍රියාව යන රටවල් හතරට මැදිව පිහිටා ඇති සන්ධීය රාජ්‍ය වන්නේ,
(1) බෙල්ජියම (2) ඕස්ට්‍රේලියාව
(3) ස්විට්සර්ලන්තය (4) ඇමරිකා එක්සත් ජනපදය

24. ස්විට්සර්ලන්ත ප්‍රාන්ත රාජ්‍ය හෙවත් කැන්ටන් සතු බලතලයක් නොවන්නේ,
(1) විදේශ කටයුතු (2) අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය
(3) පුවත්පත් පාලනය (4) බෝවන රෝග වැළැක්වීම

25. ඇමරිකානු ප්‍රාන්තවල අභිලාශයන් නියෝජනය කිරීම සඳහා ප්‍රාන්තයකින් දෙදෙනෙකු බැගින් සෙනෙට් සභාවට පත් කරන මුළු නියෝජිතයින් ගණන වන්නේ,
(1) පනහකි (2) සියයකි (3) හැටකි (4) දෙසීයකි

26. A - ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතීම
B - ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලය ඉහළ අධිකරණයකට පැවරීම
C - ආණ්ඩුව සතු ත්‍රිවිධ ආයතනවල බලය එක් ආණ්ඩුවක් ක්‍රියාවට නැංවීම.
D - අවශ්‍ය ඕනෑම අවස්ථාවක විමධ්‍යගත කළ බලය මධ්‍යම ආණ්ඩුවට ලබාගත හැකි වීම.
I සන්ධීය රාජ්‍යයක ලක්ෂණ ඇතුළත් ප්‍රකාශ වන්නේ,
(1) A හා B ය. (2) B හා D ය. (3) B හා C ය. (4) D හා A ය.

27. මෙහි ඒකීය රාජ්‍යයක ලක්ෂණ දක්වෙන ප්‍රකාශ වන්නේ,
(1) A හා C ය. (2) C හා B ය. (3) C හා D ය. (4) A හා D ය.

28. ''ඇදහිලි, චින්තන ක්‍රම, ව්‍යවහාරික කලා, ජීවන පිළිවෙත්, සිරිත් විරිත්, සම්ප්‍රදායයන් හා සාමාජිය වශයෙන් සම්මත කරගත් ක්‍රියා කිරීමේ විධි සංස්කෘතියයි.'' යන නිර්වචනය ඉදිරිපත් කළේ,
(1) ටී. බී. ටයිලර් (2) චාර්ල්ස් එල්වුඩ් (3) ඊ. ටී. හිලර් (4) ජීන් බොඩෑන්

29. සංකීර්ණ බහු සංස්කෘතික ලක්ෂණ සහිත රටක් වන්නේ,
(1) ශ්‍රී ලංකාව (2) කියුබාව
(3) චීනය (4) ඇමරිකා එක්සත් ජනපදය

30. ශ්‍රී ලංකාවට පැමිණි සංක්‍රමණික කණ්ඩායමක් වන්නේ,
(1) පණ්ඩු පාරින්ද ඇතුළු පිරිස (2) අරාබි ජාතිකයින්
(3) බටහිර යුරෝපා ජාතීන් (4) භද්දකච්චායනා ඇතුළු පිරිස

31. බහු සංස්කෘතික භාවය ප්‍රයෝජනයට ගෙන සංවර්ධනය වූ රටක් වන්නේ,
(1) චීනය (2) කියුබාව (3) සිංගප්පූරුව (4) ජර්මනිය

32. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන යුගයේ දී ආර්ථික භෝග වගාවන් සිදු කිරීම සඳහා ගෙන්වා ගත් ජාතීන් වන්නේ,
(1) දකුණු ඉන්දීය ද්‍රවිඩ ජාතිකයින් (2) චීන ජාතිකයින්
(3) බටහිර ජාතිකයින් (4) අප්‍රිකානු වහලුන්

33. බහු සංස්කෘතික සමාජයක පුරවැසියෙකුගේ වගකීම වන්නේ,
(1) වැඩි පිරිසක් අයත් වන සංස්කෘතියට අනුගතව කටයුතු කිරීම
(2) අන්‍ය ආගම් නොසලකා හැරීම
(3) තමන්ගේ සංස්කෘතිය ඉස්මතු වන සේ කටයුතු කිරීම.
(4) ගැටුම් ඇති නොවන සේ කටයුතු කිරීම

34. ශ්‍රී ලංකාවේ ජනවර්ග අතුරෙන් 74.9%ක් වූ ප්‍රතිශතයක් ඇති ජන වර්ගය වන්නේ,
(1) ද්‍රවිඩ (2) සිංහල (3) මුස්ලිම් (4) වෙනත්

35. සමාජ සාධාරණත්වය බිඳ වැටීමට හේතුවක් ලෙස සඳහන් කළ හැකි වන්නේ,
(1) ජනතා සුබ සිද්ධිය උපරිම වන අයුරින් කටයුතු කිරීම
(2) අනවශ්‍ය ආකාරයෙන් බලය විමධ්‍යගත වීම
(3) සමාජ සාධාරණත්වය සුරැකීම
(4) විනිවිදභාවයෙන් වංචා හා දූෂණයෙන් තොරව කටයුතු කිරීම

36. ශ්‍රී ලංකා ජාතික ගීයේ සියලු ජනතාවගේ එකමුතු බව හා සහජීවනය පෙන්නුම් කරන අනගි පදය වන්නේ,
(1) එක මවකගෙ දරු කැල බැවිනා... (2) ඔබ අප ආලෝකේ අපගේ අනුප්‍රාණේ
(3) ඔබ වේ අප ශක්ති අප හද තුළ භක්ති (4) අපි ඔක්කොම රජවරු ඔක්කොම වැසියෝ

37. නූතන ජාතික රාජ්‍ය සංකල්පයේ අදහස වන්නේ,
(1) එක් ජන වර්ගයකට එක් රාජ්‍යයක් යන්නයි
(2) එක් ආගමකට එක් රාජ්‍යයක් යන්නයි
(3) එක් ජාතියකට එක් රාජ්‍යයක් යන්නයි
(4) එක් සංස්කෘතියකට අයත් ජනතාවකට එක් රාජ්‍යයක් යන්නයි.

38. වර්තමානයේ ප්‍රාන්ත ආණ්ඩු ඉක්මවා යමින් ඇමරිකා එක්සත් ජනපද මධ්‍යම ආණ්ඩුව ශක්තිමත් වෙමින් පවතින බව පෙන්වීමට අදාළ නොවන කරුණක් වන්නේ,
(1) මූල්‍යමය වශයෙන් මධ්‍යම ආණ්ඩුව ශක්තිමත් වීම
(2) දෙවන ලෝක යුද්ධයෙන් පසු අන්තර්ජාතික වශයෙන් පවතින බල අරගලය
(3) සමාජ, දේශපාලන, ආර්ථික ගැටලුවල සංකීර්ණ බව
(4) ප්‍රාන්ත රාජ්‍ය සතු බලතල ක්‍රියත්මක කිරීමේ දී ගැටළු මතුවීම.

39. පළාත් සභාවේ මහ ඇමති ඇතුළු ඇමතිවරු සිවු දෙනෙකු තෝරා පත්කර ගනු ලබන්නේ,
(1) ජනාධිපති විසින් පත් කිරීමෙනි (2) පළාත් සභාවේ මන්ත්‍රීවරුන් අතරිනි.
(3) මහ ඇමතිවරයා විසිනි. (4) ව්‍යවස්ථාදායක සභාව මගිනි.

40. මධ්‍යම ආණ්ඩුව සහ පළාත් සභාව අතර සම්බන්ධීකරණය සිදු කරන පුද්ගලයා වන්නේ,
(1) මහ ඇමතිවරයා (2) අගමැතිවරයා (3) පළාත් ආණ්ඩුකාරවරයා (4) කථානායකවරයා

ලකුණු 1 5 40 = 40

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 10 ශ්‍රේණිය
## පුරවැසි අධ්‍යාපනය - II

**නම/විභාග අංකය :-- ..................................................................................... කාලය : පැය 02 යි.**

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20යි. තෝරාගත් අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

01. (i) සමාජයේ ක්‍රමික දියුණුවත් සමඟ සංවිධානාත්මක පාලන ක්‍රමයක් අවශ්‍ය වීමට හේතු දෙකක් ලියන්න.
(ii) වර්තමානයේ ඒක පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වන රටවල් දෙකක් නම් කරන්න.
(iii) ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සඳහා නියෝජිතයන් තෝරා ගැනීමේ දී අනුගමනය කරන ක්‍රම දෙක සඳහන් කරන්න.
(iv) රාජ්‍යයකට අයත් ප්‍රධාන ආයතන දෙකක් නම් කරන්න.
(v) බලයේ ස්වරූප දෙකක් සඳහන් කරන්න.
(vi) පළාත් පාලන ආයතන දෙකක් නම් කරන්න.
(vii) ඈත අතීතයේ පාලන පහසුව සඳහා බලය විමධ්‍යගත කිරීම සිදු කළ රජවරු දෙදෙනෙක් නම් කරන්න.
(viii) සංස්කෘතිය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ චින්තකයින් දෙදෙනෙක් නම් කරන්න.
(ix) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීමට බල පෑ සාධක දෙකක් ලියන්න.
(x) සංකීර්ණ බහු සංස්කෘතික ලක්ෂණ දක්නට ලැබෙන රටවල් දෙකක් නම් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

02. (i) ක්‍රි. පූ. 6 වන සියවසේ පෙරදිග ප්‍රබල රාජ්‍යයක ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ තිබූ බව සඳහන් වේ. එම රාජ්‍යය හා ජනපදය නම් කරන්න. (ලකුණු 02)
(ii) ප්‍රජාතන්ත්‍රවාදය ජීවන ක්‍රමයක් ලෙස වැදගත් වන ආකාරය පිළිබඳ කරුණු තුනක් ලියන්න. (ලකුණු 03)
(iii) සප්ත අපරිහාණි ධර්ම තුනක් ලියා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

03. (i) ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)
(ii) ප්‍රජාතන්ත්‍රවාදයේ අංග ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)
(iii) නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

04. (i) උතුරු මැද පළාතට අයත් දිස්ත්‍රික්ක දෙක නම් කරන්න. (ලකුණු 02)
(ii) පළාත් සභාවක බලතල වර්ගීකරණය කර ඇති ලැයිස්තු තුන නම් කරන්න. (ලකුණු 03)
(iii) පළාත් ආණ්ඩුකාරවරයා සතු බලතල තුනක් දක්වා ආණ්ඩුකාරවරයා ඉවත් කළ හැකි ක්‍රම දෙකක් ලියන්න.
(ලකුණු 05)

05. (i) සන්ධීය ආණ්ඩු ක්‍රම පවතින රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ඇමරිකා එක්සත් ජනපද ප්‍රාන්ත රාජ්‍යයන්ට හිමි බලතල තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ස්විට්සර්ලන්තය සන්ධීය රාජ්‍යයක් ලෙස බිහිවීමට හේතු තුනක් දක්වා එම රාජ්‍යය ගැන කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

06. (i) සංස්කෘතිය පිළිබඳ නිර්වචනයක් ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීමට බලපා ඇති කරුණු අතර ශ්‍රී ලංකාවේ පිහිටීමට අයත් කරුණු තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

07. (i) බහු සංස්කෘතික සමාජයක පුරවැසියා විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග දෙකක් දක්වන්න. (ලකුණු 02)

(ii) බහු සංස්කෘතික සමාජයක එක්සත් ව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන තුනක් ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපාන හේතු තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

**Answer**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 10 ශ්‍රේණිය
## පුරවැසි අධ්‍යාපනය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | (2) | 11. | (1) | 21. | (1) | 31. | (3) |
| 2. | (3) | 12. | (1) | 22. | (4) | 32. | (1) |
| 3. | (2) | 13. | (2) | 23. | (3) | 33. | (4) |
| 4. | (1) | 14. | (1) | 24. | (1) | 34. | (2) |
| 5. | (4) | 15. | (3) | 25. | (2) | 35. | (2) |
| 6. | (3) | 16. | (1) | 26. | (1) | 36. | (1) |
| 7. | (3) | 17. | (1) | 27. | (3) | 37. | (3) |
| 8. | (4) | 18. | (2) | 28. | (3) | 38. | (4) |
| 9. | (4) | 19. | (4) | 29. | (4) | 39. | (2) |
| 10. | (3) | 20. | (3) | 30. | (4) | 40. | (3) |

(2 5 20 = ලකුණු 40)

### II පත්‍රය

01. (i) සමාජයේ යහපැවැත්ම සඳහා /නීතිය හා ආරක්ෂාව සඳහා
(ii) උතුරු කොරියාව/කියුබාව/චීනය
(iii) සරල බහුතර නියෝජන ක්‍රමය /සමානුපාතික ක්‍රමය
(iv) නිශ්චිත භූමිය/ජනගහනය/ආණ්ඩුව/ස්වාධිපති බලය
(v) දේශපාලන/පරිපාලන/සමාජ/ආර්ථික බලයන්
(vi) මහ නගර සභා/නගර සභා
(vii) පණ්ඩුකාභය රජු/මහා පරාක්‍රමබාහු රජු
(viii) ටී.බී. ටයිලර්/ඊ.ටී. හිලර්
(ix) පිහිටීම/සංක්‍රමණ/ආක්‍රමණ/වෙළඳාම
(x) ඇමරිකා එක්සත් ජනපදය/ඉන්දියාව

02. (i) ඉන්දියාව (රාජ්‍ය) වජ්ජි (ජනපදය)
(ii) අන්‍ය මත ගරු කිරීම/සාකච්ඡා මගින් තීරණවලට එළඹීම/සමානාත්මතාව ගරු කිරීම .. (පෙළපොත 5 පිටුව)
(iii) නිතර රැස්වීම් හා සාකච්ඡා කිරීම/සමගිව රැස්වීම, සාකච්ඡා කිරීම, සමගිව විසිර යාම/වැඩිහිටියන්ට ගරු කිරීම අවවාද පිළිගැනීම

විස්තරය අනුව ලකුණු දෙන්න.

03. (i) ඒබ්‍රහම් ලින්කන්/සීලර්
(ii) තරඟකාරී පක්ෂ ක්‍රමය/ඡන්ද කොට්ඨාස ක්‍රමය/නිදහස් හා සාධාරණ මැතිවරණ
(iii) නියමිත කාල සීමාව තුළ මැතිවරණ පැවැත්වීම/නියමිත සුදුසුකම් සපුරා ඇති ඡන්ද දායකත්වය/අපේක්ෂකත්වය අගය කිරීම/මැතිවරණ නීතිරීති වලට අනුකූල වීම

විස්තරය අනුව ලකුණු දෙන්න.

04. (i) අනුරාධපුරය/පොළොන්නරුව

**Answer**

(ii) පළාත් සභා ලැයිස්තුව (I)/සංවෘත ලැයිස්තුව (II) සමගාමී ලැයිස්තුව (III)

(iii) । පළාත් සභාව කැඳවීම, වාර අවසාන කිරීම, විසුරුවා හැරීම, සංදේශ යැවීම/පළාත් සභා ප්‍රඥප්ති අනුමත කිරීම.

। ඉල්ලා අස්වීම/පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ 2/3 බහුතර බලයෙන් ජනාධිපතිවරයා විසින් ඉවත් කිරීම.

05. (i) ඇමරිකා එක්සත් ජනපදය/ස්විට්සර්ලන්තය

(ii) අධ්‍යාපනය/සෞඛ්‍ය/නිවාස ඉදිකිරීම/පළාත් පාලන

(iii) බලවත් රටවල් හතරකට මායිම් ව පිහිටීම නිසා ජාතික ආරක්ෂාවට තර්ජන එල්ල වීම/ආර්ථික සංවර්ධනය පහසු කර ගැනීමට පියවරක් ලෙස/භාෂා, ආගමික, වාර්ගික විවිධත්වයට විසඳුම් ලබා ගැනීම

ප්‍රංශය, ඉතාලිය, ජර්මනිය, ඔස්ට්‍රියාව වැනි රාජ්‍යයන්ට මැදිව දැඩි භූගෝලීය විෂමතා සහිත වීම/නිල භාෂා ලෙස ජර්මන්, ප්‍රංශ භාෂා ... (පෙළ පොත 55 පිටුව)

06. (i) ඇදහිලි, චින්තන ක්‍රම, සිරිත් විරිත්, සම්ප්‍රදායයන් වල එකතුව සංස්කෘතියයි.

(ii) විවිධ ජන වර්ග/විවිධ ආගම්/විවිධ භාෂා/සිරිත් විරිත් දක්නට ලැබීම

(iii) භූගෝලීය පිහිටීම/ඉන්දියාවට ආසන්න වීම/ඉන්දියානු සාගරයේ මධ්‍යගතව සිටීම... (පෙළ පොත 62 පිටුව)

විස්තරයට අනුව ලකුණු දෙන්න.

07. (i) අන්‍ය ආගම් ගරු කිරීම/අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම

(ii) ජාතික සමගිය වර්ධනය වේ/ගැටුම් අවම වේ/විශ්වාසය තහවුරු වේ. (පෙළ පොත 67 පිටුව)

(iii) අනවශ්‍ය ලෙස බලය විමධ්‍යගත වීම/අල්ලස හා දූෂණය ඉහළ යාම/නිලධාරිවාදය.. (පෙළ පොත 63 පිටුව)

විස්තරයට අනුව ලකුණු දෙන්න.